# ඊසාක් සහ රෙබෙකා

- 8th Story-



52Page

**ආබ්‍රහම්** ඊසාක් දැන් විවාහ වෙන්න සුදුසු වයසත් ඇවිල්ලා. ඒ නිසා ඔහුට ඉතාම හොඳ භාර්යාවක් හොයලා දෙන්න ඕන.

**පොතේ ගුරා** තමන්ගේ පුතා වූ ඊසාක්ට භාර්යාවක් සොයා දෙන්න ආබ්‍රහම් තීරණය කළා. ඒත් ඊසාක්ෂ කානානිය ස්ත්‍රියක් විවාහ කර ගන්න එකට ආබ්‍රහම් කැමති වුණේ නෑ. ආබ්‍රහම් සිතුවේ ඔහුගේම මවුබිම වන හාරාන් වලින් භාර්යාවක් සොයා ගත්තොත් හොඳයි කියලා. ඒ නිසා ආබ්‍රහම් ඔහුගේ විශ්වාසවන්ත දාසයාට කතා කළා.

**ආබ්‍රහම්** ඔබ හාරාන් වලට ගොස් මගේ පුතා වන ඊසාක්ට භාර්යාවක් සොයන්න. දෙවියන්වහන්සේම ඔබට මඟ පෙන්වනවා ඇත.

**පොතේ ගුරා** එවිට මෙහෙකරුවාෂ ඊසාක්ගේ භාර්යාව වෙන්න සිටින කෙනාට තෑග්ගක් වශයෙන් ඔටුවන් 10 දෙනෙක් දෂරුගෙන පිටත්ව යනවා.
පොතේ ගුරා - අවසානයේ දී ආබ්‍රහම්ගේ මෙහෙකරුවා හාරාන් වලට ළඟා වෙද්දී රාත්‍රී කෑම වෙලාවට ළංව තිබුණා.
ඔහුගේ දීර්ඝ ගමනින් පසුව පොඩි විවේකයක් ලබන පිණිස නුවරින් පිටත තියෙන ළිඳක් ළඟ වාඩි වුණා.
ඒ වේලාවේ රාත්‍රී කෑම සූදානම් කරන පිණිස වතුර හොයන්නට ආපු බොහෝ තරුණ කාන්තාවන් ළිඳ ළඟ සිටියා.

**මෙහෙකරුවා** මම කොහෙන්ද ඊසාක්ට භාර්යාවක් හොයා ගන්නේ ?

**පොතේ ගුරා** මේ වයසක මෙහෙකරුවා අපේක්ෂා භංගත්වයට පැමිණ සිටියා. එහෙත් ඔහුට ආබ්‍රහම්ගේ වචන සිහිපත් වුණා.

**ආබ්‍රහම්** දෙවියන්වහන්සේම ඔබට මඟ පෙන්වාවී.

..............................................................................................



53Page

**පොතේ ගුරා** මෙහෙකරුවා ළිඳ ළඟ දණ ගසා ස්වාමින්වහන්සේට යාච්ඥා කළා.

**මෙහෙකරුවා** ස්වාමිනිෂ මේ නගරයේ ඉන්න බොහෝ දූවරු වතුර අදින පිණිස මේ ස්ථානයට එනවා. මේ එන අයගෙන් මටත් මගේ ඔටුවන්ටත් වතුර බොන්ට දෙමියි කියන තැනැත්තියෂ ඔබවහන්සේ ඊසාක්ට නියම කළ තැනැත්තිය බව මම දැනගන්න යනවා.

..............................................................................................



54Page

**පොතේ ගුරා** මේ වෙලාවේ ඉක්මනින්ම කළයක් රැගත් කාන්තාවක'ළිඳ ළඟට එනවා. ඇය ඉතා ප්‍රේමණීය සහ අහිංසක පෙනුමක් සහිත තැනැත්තියක්. මෙහෙකරුවා ඇය වතුර අදින ආකාරය දෙස බලා සිටියා. මෙහෙකරුවා ඇයට කතා කර මෙහෙම කියනවා.

**මෙහෙකරුවා** ඔබේ කළයෙන් මට වතුර ටිකක් දෙන්න පුලුවන් ද ?

**රෙබෙකා** බොන්න මගේ ස්වාමිනිෂ මම ඔබගේ ඔටුවන්ටත් බීලා ඉවර වෙනකං වතුර ඇදලා දෙන්නම්.

**පොතේ ගුරා** — මෙහෙකරුවා මේ දේ අහපු ගමන් පුදුමයට පත් වුණා.

**මෙහෙකරුවා** — ආහ්... දෙවියන්වහන්සේ මගේ යාච්ඤාව අසා තිබෙනවා.
මගේ ස්වාමියා වන ඊසාක්ට භාර්යාව වෙන්න යන්නේ මේ කාන්තාව තමා.
ඊසාක්ට භාර්යාව වීමට යන කාන්තාව මුණ ගැසීම නිසාඝ මේ මෙහෙක-

**පොතේ ගුරා** — රුවා පුදුම ප්‍රීතියකට පත් වුණා.

.................................................................................


55Page


**පොතේ ගුරා** — මේ කාන්තාවගේ නම රෙබෙකා. මේ මෙහෙකරුවා රෙබෙකාට රන් මුදුවක් දඝ රන් වළලු දෙකක් ද තෑග්ගක් වශයෙන් දීලා ඇගේ පියා හමුවීමට නිවසට යනවා. රෙබෙකාගේ අම්මා සහ තාත්තා මේ මෙහෙක-රුවාව ආදරයෙන් පිළිගත්තා. මෙහෙකරුවාඝ නිවසට පැමිණීමේ හේතුව රෙබෙකාගේ තාත්තාට පැහැදිලි කරයි.

**මෙහෙකරුවා** — මම ආබ්‍රහම්ගේ සේවකයෙක්. මගේ සවාමියාට ඊසාක'නම් පුතෙක් සිටිනවා. මම මෙහි පැමිණියේ මගේ ස්වාමියා වන ඊසාක්ට භාර්යාවක් සොයා ගැනීමට.

**තාත්තා** — මේක නම් දෙවියන්වහන්සේගේ වැඩක්. මේ ඉන්නේ රෙබෙකා.
ඔබේ ස්වාමියාගේ පුතාට භාර්යාව වන පිණිස ඔබ ඇයව රැගෙන යන්න.

**පොතේ ගුරා** — මේ විවාහය පිණිස රෙබෙකාගේ තාත්තගේ කැමැත්ත ආබ්‍රහම්ගේ මෙ-හෙකරුවට ලැබෙනවා.
ඒ වගේම රෙබෙකාත් පිටත්ව යාමට තමන් කැමති බව ප්‍රකාශ කරනවා.

.................................................................................


56Page

**පොතේ ගුරා** — පසු දින උදෑසනම මෙහෙකරුවාත්ඝ රෙබෙකාත් ආබ්‍රහම්ගේ නිවසට යාම පිණිස පිටත් වුණා.
ඒ වන විටත් ඊසාක් කෙතෙහි මෙනෙහි කරමින් සිටියා.

**ඊසාක්** — කවුද ඒ කාන්තාව ?

**පොතේ ගුරා** — ඊසාක්ඝ මෙහෙකරුවා ළඟට එනවා.
මෙහෙකරුවා සිද්ධ වුණු හැමදේම ඊසාක්ට පැහැදිලි කළා.
ඉන්පසු ඊසාක් ඇයව තමන්ගේ නිවසට ගෙන ගියා.
ඉන්පසු ඊසාක් සහ රෙබෙකා ගොඩාක් අයගේ ආශිර්වාද මැද විවාහ වුණා. ගොඩාක් අයගේ ආදරය මැද ඒ දෙන්නා සතුටින් ජීවත් වුණා.

.................................................................................


57Page

**ජීවිතයට අදාල කිරීම** — දුවේ පුතේ, ජීවිතේ වැදගත් තීරණ ගද්දී දෙමව්පියන්ගේ වචනවලට ගරු කරන්න. ඒ වගේම දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයන්න.
උන්වහන්සේට කකීරු අයට උන්වහන්සේ ආශීර්වාද කරන සේක.